# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය



## ආර්ථික විද්‍යාත්මක ඇසින්

සිංහල හෝ දෙමළ මාධ්‍ය අධ්‍යාපනය යටත්විජිත යුගයේ සිටම ලාංකිකයන්ට නොමිලයේ ලබාගත හැකි වූ නමුත්, උසස් ගුණාත්මක ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපන ආයතන පිහිටියේ ප්‍රධාන නගර සීමාවන් තුළ ප්‍රධාන වශයෙන් වත්කම් ඇති අතළොස්සකට සීමා වූ ඒවා ලෙසය. 1943 කන්නන්ගර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවල අරමුණ වූයේ ඇත්ත වශයෙන්ම නිදහස් අධ්‍යාපනයක් සෑම දරුවෙක්ටම සපයා දීමයි. තම නිවෙස් සමීපයේ පාසැල්වල ප්‍රාථමික අධ්‍යාපනය සාර්ථකව අවසන් කළ දක්ෂ දරු දැරියන් හට ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනයක් ලබා ගත හැකි වන ලෙස සෑම මැතිවරණ කොට්ඨාශයක් තුළම මධ්‍ය මහා විද්‍යාලයක් බැගින් පිහිටුවීම එම ප්‍රතිසංස්කරණ වල වැදගත් අංගයක් විය.

වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන තත්ත්වය කෙසේද යත් අප සම්පූර්ණ වටයක් ගමන් කර පෙර සිටි ස්ථානයටම නැවතත් පැමිණ ඇති බවක් පෙනේ. වත්මන් තත්ත්වය අනුව, ගුණාත්මක බවෙන් ඉතා අඩු සිංහල හෝ දෙමළ මාධ්‍ය අධ්‍යාපනයක් නොමිලයේ ලබා ගත හැකි නමුත්, ඉංග්‍රීසි භාෂා දැනුමක් සහිත උසස් ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමේ වාසනාව හිමි වන්නේ ප්‍රධාන නගරවලට සීමා වී ඇති 'සුපිරි' පාසැල් 100කට ප්‍රවේශය ලබා ගැනීමේ වරප්‍රසාද ලත් සීමිත සංඛ්‍යාවකට පමණකි.

'සුපිරි' පාසැල් : 2007 වසර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පස්වන ශ්‍රේණියට පිවිසීමේ ලකුණු සීමා නිර්දේශ සළකා බැලුවහොත්, ශිෂ්‍යත්ව විභාගය සමත් වන සිසුන් ඇතුල්වීමට වඩාත්ම කැමති පාසැල් 106 ක් ඇත. මෙම 'සුපිරි' පාසැල් පිහිටා තිබෙන්නේ දිවයිනේ අධ්‍යාපන කළාප 93න් 33 ක් තුළ පමණකි.

**1947** **එවකට මැතිවරණ කොට්ඨාශ 50 න් 50 තුළම ඉතා උසස් තත්ත්වයක මධ්‍යම විදුහල් එකක් හෝ තිබිණ.**

**2008** **මෙරට අධ්‍යාපන කළාප 93 අතරින්, එක් 'සුපිරි' පාසැලක් හෝ පිහිටා ඇත්තේ කළාප 33 ක පමණකි.**

**'සුපිරි' පාසැල් වෙත ප්‍රවේශය :** පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සියළුම දරු දැරියන්ට සුපිරි පාසැල්වලට ඇතුළත් වීම ගැන බලාපොරොත්තු දෙන නමුත්, එම බලාපොරොත්තුව වැඩි දෙනාට මිරිඟුවක් වැනිය. මෙම සුපිරි පාසැල් බොහෝමයක් පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගන්නේ කුසලතා මත පදනම් නොවූ සුදුසුකම් මත හෙයින්, පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුන්ට ඇත්තේ ඉතා සීමිත ඉඩ ප්‍රමාණයකි. මේ හැරුණු විට, 'සුපිරි' පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම ඉමහත් කණස්සල්ලට හේතුවන සමාජයීය සංසිද්ධීන්ට තුඩු දෙන පොරයක් බවට පත්ව ඇත.

තම දරුවකු පළමුවන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා දෙමාපියන් තමන් කැමති පාසැලක් තීරණය කළ පසු ඔවුන් එම පාසැලේ සිට නියමිත දුර ප්‍රමාණය ඇතුළත පදිංචි වී සිටින බව 'සනාථ කිරීම' සඳහා ව්‍යාජ සහතික හා ව්‍යාජ ලිපි ලේඛන මිටි ගණන් ඉදිරිපත් කරති. විදුහල්පතිවරු හා ගුරුවරු ද, දෙමාපියන් ඉදිරිපත් කරන ලේඛනවල ව්‍යාජභාවය හෙළිකරගැනීමට හැකි වන ප්‍රශ්න සම්මුඛ පරීක්ෂණයේදී ළමුන්ගෙන් අසති. දෙමාපියෝ තම ප්‍රෝඩාව හසු නොවන පරිදි තම දරුවන්ට බොරු කීමට පුරුදු පුහුණු කර සම්මුඛ පරීක්ෂණයට එවති. ( S.C.(FR) 10/07, 11/07, 12/07, 13/07 ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව)

**ප්‍රතිපත්ති සන්නිවේශණ 09**

**කාර්යක්ෂමතාව, සඵලතාව, සහ සාධාරණත්වය :** අධ්‍යාපනයක් සැබවින්ම නිදහස් එකක් වන්නේ සෑම දරු දැරියක්ටම ජාති ආගම් දුප්පත් පොහොසත් බේදයක් නැතිව ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලබා ගැනීමේ සම අවස්ථා තිබීමෙනි. මෙම සම අවස්ථා ඇති කිරීම සඳහා රජය විසින් මැදිහත් වීම ලෝකයේ සෑම රටකම වාගේ සිදුවේ.

සියළුම දරු දැරියන් වෙත අධ්‍යාපනය ලබා දීමට සැලසීමට රජයක් කරන ආයෝජන තුළින් සමස්ත සමාජය වෙත ම ඉමහත් යහපතක් ඇති වන බව ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති. ප්‍රාථමික අධ්‍යාපනය පසු කර, ද්විතිය අධ්‍යාපනය වෙත ඉහළට යන විට අධ්‍යාපනයේ සමාජයීය ඵලදාව හීන වෙමින් තෘතියික අධ්‍යාපන මට්ටම වෙත යන විට, අධ්‍යාපනයේ පුද්ගලික ඵලදාව එහි සමාජයීය ඵලදාවට වඩා විශාල වේ. එහෙයින්, සියළුම දරු දැරියන් වෙත පොදු සේවාවක් වශයෙන් රජය විසින් අධ්‍යාපන පහසුකම් සැලසීම යහපත් ආර්ථික විද්‍යාත්මක මූලධර්යකි.

නමුත් අධ්‍යාපන සේවාවන් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ජනතාව වෙත ලබා දීමට රජය අසමත් වන විට, අධ්‍යාපන ක්‍රමය තමන් වෙත වාසිදායක ලෙස යොදා ගැනීමට ධනවත් හා බලවත් අය නොයෙකුත් ක්‍රම සහ විධි සොයා ගනිති. නැතහොත් ඔව්හු එම අධ්‍යාපන ක්‍රමය අතහැර දමා වෙන ක්‍රමයක් වෙත යොමු වෙති. එහෙත් ධනය හෝ බලය අහිමි අයට එම අසාර්ථක අධ්‍යාපන ක්‍රමය තුළ රැඳී සිටීම විනා කළ හැකි වෙනත් දෙයක් නොමැත. ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමේ වරම් ඔවුනට අහිමි කිරීම තුළින් සමාජයට විශාල පාඩුවක් සිදුවේ. තවද, ඔවුනට පුද්ගලිකව සිදුවන පාඩුව සමාජය විසින් ඔවුන් වෙත එල්ල කරන විශාල අසාධාරණයකි.

**කෙටියෙන් කිවහොත්, අධ්‍යාපන ක්ෂේත්‍රයක් තුළ අසාධාරණතාවලට විශාල වශයෙන්ම වගකිව යුත්තේ අකාර්යක්ෂම ලෙස හා ඵලදායී නොවන ලෙස ක්‍රියාත්මක වන රාජ්‍ය අධ්‍යාපන ක්‍රමයකි.**

ඒ නිසා අධ්‍යාපනයේ සාධාරණත්වය පිළිබඳ ඕනෑම සාකච්ඡාවකදී අධ්‍යාපන සේවාවල ඵලදායිතාව හා කාර්යක්ෂමතාව සළකා බැලීම අනිවාර්‍ය වේ.

ශ්‍රී ලංකාවේ වර්තමනා අධ්‍යාපන ක්‍රමය දෙස සමීප අවධානයක් යොමු කළහොත්, එම අධ්‍යාපන පද්ධතිය ඇත්තෙන්ම අකාර්යක්ෂම නිශ්ඵල හා කිසිසේත් සාධාරණ නොවන එකක් බව පෙනී යයි.

## කාර්යක්ෂමතාව

යම් සේවයක් සපයන්නා ඒකාධිකාරී තත්ත්වයක් භුක්තිවිඳී නම් හා ශ්‍රම ශක්තිය ඇතුළු සම්පත් අකාර්යක්ෂම ලෙස භාවිතා කරන්නේ නම්, එම සේවාව සඳහා අධි මිලක් ගෙවීමට පාරිභෝගිකයා හට සිදුවේ. තවද යම් සේවයක් සඳහා දෙවතාවක් ගෙවීම අනවශ්‍ය බවද පැහැදිළිය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ මෙම අකාර්යක්ෂමතා සාධක දෙකම පවතී.

- ලංකාවේ සිසු-ගුරු අනුපාතයේ සාමාන්‍යය 19 ක් වේ. මෙය ආසියාවේ අඩුම අනුපාතයක් වන නමුත්, බොහෝ අවස්ථාවලදී අවැසි තැනට අවැසි ගුරුවරුන් නැත.
- විෂය මාලා, පෙළ පොත් හා විභාග ආශ්‍රිත තොරතුරු නිසි කලට නොලැබේ. ලබා දෙන තොරතුරු හා ද්‍රව්‍ය වල අඩුපාඩු බොහෝය.
- අධ්‍යාපන පරිපාලනය සඳහා රජය දෙවරක් වියදම් දරයි. ප්‍රථමයෙන් මධ්‍යම රජයේ ආයතනික වියදම් වශයෙන් හා දෙවනුව පළාත් සභාවල වියදම් වශයෙනි.
- දෙමාපියෝ ද අධ්‍යාපනය සඳහා දෙවරක් වියදම් කරති. පළමුව රජයේ අධ්‍යාපන වියදම් සඳහා බදු මුදල් තුළින් හා, දෙවනුව ටියුෂන් සඳහා ගෙවන ගාස්තු තුළිනි.

මූලිකයා හා නියෝජිතයා අතර පැන නගින ගැටලු නිසා, පොදු සේවා සැපයීමේදී අකාර්යක්ෂමතා සිදුවන බව ආර්ථික විද්‍යාවේ පොදු අභිමත න්‍යාය පෙන්වා දෙයි. අධ්‍යාපන ක්ෂෙත්‍රයේ මූලිකයෝ දෙමාපියන්යත ඡන්දයෙන් තෝරා ගත් පාලකයෝ හා රජයේ සේවකයෝ නියෝජිතයන්ය. එම දෙමාපියන් හා ඒ අය බලාපොරොත්තු වන සේවාව අතර ඇති නියෝජිත ස්ථරයන් වැඩි වන විට අධ්‍යාපන සේවාවන්හි අකාර්යක්ෂමතාව වැඩිවීම අනිවාර්‍යයෙන්ම සිදු වේ.

## සඵලතාව

ගොඩනැගිලි, ගුරුවරු, පොත්පත් හා විෂයමාලා යනාදිය තිබීමෙන්ම අධ්‍යාපන සේවාවේ ගුණාත්මක බව ඇති නොවේ.

ගුණාත්මකභාවයෙන් උසස් සේවාවක් සහතික කළ හැක්කේ වෙළඳපොළ යාන්ත්‍රණය මගින් බව ආර්ථික විද්‍යාව අපට උගන්වන නමුත්, අධ්‍යාපනය වෙනත් සාමාන්‍ය සේවාවන්ට සමාන නොවේ. පොදු අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සහතික කර හැක්කේ ඒ පිළිබඳ නිරන්තරයෙන් වගවීමේ යාන්ත්‍රණ ඇති කිරීම තුළින්ය.

ශ්‍රී ලංකාවේ පාසැලට පැමිණීම පිළිබඳ සංඛ්‍යා ලේඛන ආසියානු කලාපයේ අනෙක් රටවල් හා සන්සන්දනය කරන විට ඉතා සතුටුදායකය. උදාහරණයක් ලෙස, ළමුන් 85% ක් නව වන ශ්‍රේණිය සම්පූර්ණ කරයි. ඔවුන් ලබන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ හොඳ තොරතුරු අපට නොමැති වුවද පස් වන ශ්‍රේණියේ සාධන පරීක්ෂණ වලින් හා අ.පො.ස. (සා.පෙ.) විභාග ප්‍රතිඵලවලින් පෙනී යන්නේ **අනිවාර්ය අධ්‍යාපනය අවසන් කරන සිසුන් අතරින් 50% කට වත් අවශ්‍ය දැනුම් හෝ කුසලතා නැති බවයි.**

## සාධාරණතාව

රජයේ සේවාවන් අකාර්යක්ෂම හා අඵලදායී වූ විට එයින් අසාධාරණයක් සිදු වන්නේ දුප්පත් පීඩිත ජනතාවට ය. අප රටේ අධ්‍යාපනය නිදහස් යයි පැවසෙන නමුත්, ඒ තුළ ඉතා විශාල අසාධාරණතාවන් දක්නට ලැබේ. උදාහරණ ලෙසඃ

**පාසැල් බහුතරයකට අවශ්‍ය මූලික පහසුකම් සපුරා නොමැති අතර, වඩාත් දුප්පත් පාසැල්වල තත්ත්වය වඩා නරකය.**

තම අවශ්‍යතා සමහරක් සපුරා ගැනීම සඳහා, විවිධ සුභසාධන වැඩසටහන් මාර්ගයෙන් අමතර අරමුදල් ලබා ගැනීමට අවසර වර්තමාන නීතිරීති පාසැල් අධිකාරීන් වෙත ලබා දී ඇත. ප්‍රශ්නය වන්නේ රජයේ දීමනාවලින් පිරිමසා ගත නොහැකි මූලික වියදම් දැරීමට මෙම අමතර අරමුදල් යොදා ගැනීමට දුප්පත් පාසල් වලට සිදුවීමය. විදුලිබල ගාස්තු හා දුරකථන වියදම් උදාහරණ ලෙස ගත හැක.

**2007 කොටහේන කණිෂ්ඨ විදුහලේ දෙමාපියන් විසින් කෙරුණු වියදම් :**


| | |
|---|---|
| විදුලිබල ගාස්තු | රු.91,884 න් 20% ක් |
| දුරකථන ගාස්තු | රු.41,589 න් 65%ක් |

**බොහෝ නිවෙස් වල සිට සාධාරණ දුර ප්‍රමාණයක් ඇතුළත සතුටුදායක ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා ගත හැකි පාසැලක් පිහිටා නොමැත.**

පස් අවුරුදු දරුවකු දවසේ පැය ගණනක් පාසලට යාම ඒම සඳහා වාහනයක රස්තියාදු කිරීම එම කුඩා දරුවාට කරන හිංසනයකි. එය දැන දැන ලංකාවේ බොහෝ දෙමාපියන් තම දරුවන් දුර බැහැර පාසල් වලට අරින්නේ දරුවාට ඇති අනාදරයක් නිසා නොව ලඟ ඇති පාසල පිළිබඳ අසතුට නිසාය.

ඇති දෙමාපියන් හැකි පමණින් නගරයේ පාසල් සොයන විට ගම්බද පාසල් තව දුරටත් කඩා වැටී ඒවා කිසිවක් කර කියා ගත නොහැකි දුප්පත් පවුල් වල දරුවන්ට සීමාවීම අනිවාර්‍යය. මෙම සංසිද්ධියේ හොඳම සංකේතය නඩත්තු කරගැනීමට නොහැකි තරම් කුඩා පාසල් වල වර්ධනයයි. උදාහරණයක් ලෙස, ශිෂ්‍ය සංඛ්‍යාව 51ට අඩු පාසැල් සංඛ්‍යාව 1997 දී 1,253ක් (12.4% වූ අතර, එම සංඛ්‍යාව 2007 දී 1,549 (16%) දක්වා වැඩිවිය.

**සිසුන් සංඛ්‍යාව 51 ට අඩු පාසැල් ප්‍රතිශතය**





**අධ්‍යාපන කලාප 93 අතරින් 60ක සිටින දක්ෂ සිසුන්ටසතුටුදායක අධ්‍යාපනයක් ලබා ගැනීමට ස්ථාන පහසුකම් නැත.**

ගැමි දරුවන්ට ගුණාත්මක ද්විතියික අධ්‍යාපනයක් සළසා දීම සඳහා 1943 - 1947 කාලයේදී පිහිටුවන ලද මධ්‍ය මහා විදුහල් පද්ධතිය වෙනුවට, අධ්‍යාපන කළාප 93 කින් 33 ක් තුළ සංකේන්ද්‍රනය වූ 'සුපිරි' පාසල් 106 කින් සැදුම්ලත් නව පද්ධතියක් දැන් බිහි වී ඇත.

**විද්‍යා හා වාණිජ ධාරා සඳහා පහසුකම් සීමා සහිතය. එම අඩුව වැඩියෙන් බලපාන්නේ ගම්බද පාසල්වලටය.**

12 වන හා 13 වන ශ්‍රේණිවල විද්‍යාව හා වාණිජ්‍යය ඉගැන්වීමේ පහසුකම් ඇත්තේ දිවයිනේ පාසැල් සුළු සංඛ්‍යාවකටය. එම පාසැල් ප්‍රතිශතය බස්නාහිර පළාතේ 67%ක උපරිමයක සිට වයඹ පළාතේ 34% ක අවමයක් ලෙස පළාත් අතර විෂමව බෙදී ඇත.


**12 හා 13 ශ්‍රේණිවල විද්‍යාව හා වාණිජ්‍යය හදාරන සිසුන්**




**පෞද්ගලික උපකාරක පංතිවල අවශ්‍යතාවයෙන් පෙනී යන්නේ එකම අධ්‍යාපනය සඳහා දෙමාපියන් දෙවරක් මුදල් වැය කරන බවයි.**

2005 දී මුළු අධ්‍යාපන වියදමෙන් 30 - 35% ක් පෞද්ගලිකවම දෙමාපියන් දරණ බව මහ බැංකුව විසින් පවත්වන ලද පරිභෝජන හා ගෘහීය මූල්‍ය සමීක්ෂණය පාදක කරගත් විශ්ලේෂණ වලින් හෙළිවේ. මෙම පෞද්ගලික අධ්‍යාපන වියදමෙන් 45% ක් පුද්ගලික උපකාරක පංති සඳහා යෙදවෙන බවටත් මෙම පංති වෙත ඇදෙන සිසුන් සංඛ්‍යාව වැඩි වෙමින් පවතින බවටත් දත්ත ඇත.

**පුද්ගලික උපකාරක පංතිවලට සහභාගී වන ළමුන් ප්‍රතිශතය**



# සැබවින්ම කාර්යක්ෂම, ඵලදායී සහ සාධාරණ අධ්‍යාපන පද්ධතියක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම සඳහා යෝජනා

**1. රජයේ පාසැල් පද්ධතිය ප්‍රති සංවිධාන කළ යුතුය.**

සියල්ලන් වෙත, විශේෂයෙන් දුගී ගැමි දරුවන් වෙත, සමාන අවස්ථා සළසා දීම සඳහා



වසරකට පළමුවන වසරට පිවිසෙන
325,000 ක් පමණ වූ දරුවන් සඳහා

**ප්‍රාථමික පාසැල් 6771 ක්**

කුඩා දරුවන් ඇති පවුල්වලට තම නිවෙසේ සිට සාමාන්‍යයෙන් කිලෝමීටර් 1 1/2 කට නොඅඩු දුරකින් හා සාමාන්‍යයෙන් පළමුවන වසරට එක වරකට ළමයින් 48 කට නොවැඩි ගණනක් ඇතුළු කරන

**කණිෂ්ඨ ද්විතියික පාසැල් 2708 ක්**

ප්‍රාථමික පාසල් දෙකක් හෝ තුනකින් පෝෂිත පෙදෙසක පස්වන ශ්‍රේණිය සපිරි කරන දරුවන්ට කලා, වාණිජ, විද්‍යා යන ධාරා වලින් ඕනෑම විෂය සංකලනයක් මැනවින් හැදෑරීම සඳහා එක පාසලකට සාමාන්‍යයෙන් ළමයින් 120 ට නොවැඩි ගණනකට හයවැනි ශ්‍රේණියට ප්‍රවිෂ්ඨ වීමට ඉඩ සළසන

**ජ්‍යෙෂ්ඨ ද්විතියික පීඨ 162 ක්**

රටේ ඕනෑම තැනක පහළ ද්විතියික අධ්‍යාපනය නිමකර 12 වන ශ්‍රේණියට පිවිසෙන සිසුන්ට සාමාන්‍යයෙන් සිසුන් 2000 කට එක පීඨයක් වනසේ දැනට පවතින සමහර ජාතික පාසල්, කාර්මික විද්‍යාල හා වෙනත් වෘත්තීමය පාඨමාලා සපයන රජයේ හා පෞද්ගලික ආයතන වලින් සැදුණු

**2. දැනට රජයේ පාසල් හා සමාන්තරව පවතින පෞද්ගලික හා රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා පද්ධතිය විධිමත් කළ යුතු ය.**

රජයේ පාසැල් සඳහා බලපාන දුර ප්‍රමාණය සීමාවට යටත්වීමට අකමැති පවුල්වල දරුවන්ගේ මූලික අයිතිවාසිකම් සුරැකෙන පරිදි දැනට ඇති පෞද්ගලික අධ්‍යාපන වාරණ නීති ඉවත් කර පෞද්ගලික ආයතනවල නිසි නියාමනයන් ඇති කිරීම තුළින්

**3. අධ්‍යාපන පරිපාලනය විමධ්‍යගත කළ යුතු ය.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීම ජාතික; අධ්‍යාපන ප්‍රතිපත්තිය, අධ්‍යාපන ප්‍රමිතීන්, විෂය නිර්දේශ සහ විභාග පිළිබඳ විධායක බලය ඇති ජාතික අධ්‍යාපන කොමිසමක් පත් කිරීම; ජාතික පරිපාලන පද්ධතියේ සුපරීක්ෂණය අධිකාරය පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරීම; හා අන් සියළුම රේඛීය අමාත්‍යාංශ සම්පත් පළාත් වලට බෙදා හැරීම තුළින්

**4. ගුරු-දෙගුරු ප්‍රජාවන් සවිබල ගැන්වීම**

පාසල් සංවර්ධන සමිති පිළිබඳව දැනට බලපවත්වන නීති රීති හා රෙගුලාසි වඩා ශක්තිමත් කිරීම හා ඒ සමිති කොට්ඨාශ මට්ටමෙන් ක්‍රියාකාරී සමූහයන් බවට වර්ධනය කිරීමෙන්

**5. අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳ වගකීම භාරගැනීම සඳහා යාන්ත්‍රණයක් පිහිටුවීම**

තම තමන්ගේ බල අධිකාරිය පවත්නා ප්‍රදේශ තුළ අධ්‍යාපනයේ කාර්යක්ෂමතාව, සඵලතාව හා සාධාරණත්වය සම්බන්ධයෙන් අධ්‍යාපන අධිකාරීන් ඒ ඒ පළාත්වල ව්‍යවස්ථාදායක සභාව වෙත වාර්ෂිකව වාර්තා කළ යුතු බවට අණ පනත් පැනවීමෙන්


## කතුවරයන් ගැන........

**සුජාතා එන්. ගමගේ** (PhD, MPA) **: ශ්‍රී ලංකා අධ්‍යාපන සංසදයේ කැඳවුම්කරු සහ ප්‍රගති පදනමේ විධායක අධ්‍යක්ෂිකා**

**ඕ.ජී. දයාරත්න** (PhD) **: පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**


## සංවාද .......

**පාත්ෆයින්ඩර්, පදනමේ සංවාද වැඩසටහනේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සමාජයට හා ආර්ථිකයට බලපාන ආකාරයෙන් යෝජිතව හෝ අපේක්ෂිතව ඇති ව්‍යවස්ථාමය පියවරයන් පිළිබඳව විචාරාත්මක සංවාදයක් ඇති කිරීමයි. ඔබගේ අදහස් උදහස් අප වෙත දන්වා එවන්න.**


දු.ක: *+94 11 259 6281*
ඊ-මේල්: *info@pathfinderfoundaiton.org*
වෙබ් අඩවිය: *www.sanvada.org*